## පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය - 2011

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගනනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 22 දරණ පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව පනත | |
| (i) 3 වැනි වගන්තිය | අධ්‍යයන , පර්යේෂණ , උපදේශන සේවා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු කිරීම සඳහා මුදල් සැපයීමෙන් හා ශ්‍රී ලංකා පුරවැසියන්ට විදේශීය උසස් අධ්‍යාපන ආයතන වලට යාම පිණිස සහ විදේශීය රටවල පුරවැසියන්ට ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය හැදෑරීමට විධිවිධාන සැලසීමෙන් සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යාපනයේ ප්‍රගතිය උදෙසා ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම අරමුණ වුවත් එම අරමුණ කරා ලඟාවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ii) 5 වන වගන්තිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය මගින් ව්‍යවස්ථාදායක සභාව අහෝසි කර ඇත. එබැවින් කථානායකවරයා විසින් පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරන ලෙස සභානායකතුමා වෙත දන්වා ඇතත් එම සංශෝධනයන් නොකිරීම හේතුවෙන් පාලක |

| | |
|---|---|
| | මණ්ඩලය පත්කිරීමට නොහැකි තත්ත්වයක් ඇතිවී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 9.1 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරීන් 04 දෙනෙකු නැවත සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය තුලදී රු. 1,019,657 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 702,293 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,026,711 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.324,418 ක අඩුවීමක් දක්නට ලැබුණි. ස්ථාවර තැන්පතු පොලිය රු. 324,418 කින් අඩුවීමද , වේතන හා නඩත්තු වියදම් වල රු. 113,480 ක වැඩිවීමද මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලොචනය

### 3.1 කාර්ය සාධනය

2003 නොවැම්බර් මාසයේ ආරම්භ කරන ලද පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලයෙන් 2007 වර්ෂය අවසානය තෙක් ලබා දී තිබුණේ ශිෂ්‍යත්ව 03 ක් පමණි. මෙම ශිෂ්‍යත්ව 03 සඳහා 2003 නොවැම්බර් මාසයේ සිට 2007 වර්ෂයේ අවසානය දක්වා රු. 16,238,162 ක වියදමක් දරා තිබුණි. 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිම ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබූ අතර මණ්ඩලය පවත්වාගැනීමේ පරිපාලන වියදම් වශයෙන් මෙම කාලසීමාව සඳහා පිළිවෙලින් රු.3,384,321, රු.3,604,850, රු. 3,800,776, ක් සහ රු. 3,830,947ක් දරා තිබුණි.

3.2 ආර්ථික නොවූ ගණුදෙනු

----------------------------

රාජ්‍ය දැව සංස්ථාවෙන් 2004 පෙබරවාරි 20 දින විධායක මේස 02 ක් හා විධායක පුටු 10 ක් රු. 48,620 කට මිලදී ගෙන තිබුණි.මෙම භාණ්ඩ පාර්ලිමේන්තුවේ කමිටු ශාලා අංක 02 හි වර්ෂ 05 ක පමණ කාලයක් ගබඩා කර තිබුණු අතර එම භාණ්ඩ මණ්ඩලයේ භාවිතයට නොගෙන 2008 දෙසැම්බර් 10 වන දින පාර්ලිමේන්තුව වෙත භාර දී තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම හා කාර්ය සාධන වාර්තාව සකස් කර නොතිබුණි. "පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලයට පාලක මණ්ඩලයක් පත්කර නොතිබූ හෙයින් එම වාර්තා සකස් කළ නොහැකි " බව සහකාර ලේකම්වරයා දන්වා තිබුණි.

5. **පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර පාලක මණ්ඩලයේ ලේකම්වරයාගේ අවධානය යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) කාර්ය මණ්ඩල පත්කිරීම්

(ආ) අභ්‍යන්තර පාලනය